සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

නම/විභාග අංකයː-.............................. පුරවැසි අධ්‍යාපනය කාලයː-පැය 02යි

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

01. භෞතික විද්‍යා මහාචාර්යවරයෙකු මෙන්ම දක්ෂ වයලින් වාදකයෙක් වූයේ ............................................ ය.
(ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ/ගැලිලියෝ ගැලිලි/ඇල්බට් අයින්ස්ටයින්)

02. පොතපත කියවීම ........................................................ ව්‍යායාමයකි
(මනසට/මොළයට/හදවතට)

03. යම් අරමුණක් සාර්ථක ලෙස ඉටුකර ගැනීමේ දී එයට එල්ලවන සීමා ...................................................................... ලෙස හඳුන්වයි. (බාධක/අභියෝග/මායිම්)

04. අනතුරු හා ආපදා අවස්ථාවකදී සම්බන්ධ වන ආයතනයක් ලෙස .................................................... දැක්විය හැකිය.
(ගිලන් රථ සේවය/සිවිල් ආරක්ෂක බලකාය/විශේෂ කාර්ය බලකාය)

05. රැකියාවක් සොයා ගැනීම සඳහා උපයෝගී කරගත හැකි මාධ්‍යයක් ලෙස .................................................. දැක්විය හැක.
(පුවත්පත්/රූපවාහිනිය/ගුවන් විදුලිය)

- අංක 06 සිට 10 දක්වා වගන්ති හරිනම් (4) ලකුණ ද වැරදි නම් (5) ලකුණ ද වරහන තුළ යොදන්න.

06. නගර නිර්මාණය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලැබුණු දායාදයකි. ( )
07. තමා කරන ඕනෑම කාර්යයක් අධිෂ්ඨානයෙන් හා කැපවීමෙන් සිදුකිරීම අවශ්‍ය නැත. ( )
08. සමාජ සුරක්ෂිතතාවයට පුද්ගල චර්යාවන් එතරම් බලපෑමක් සිදු නොකරයි. ( )
09. තමා පිළිබඳ ස්වයං ඇගයීම මගින් තම හැකියා, ලැදියා අපේක්ෂා හඳුනා ගත හැකිය. ( )
10. රැකියා වෙළඳපලේ කාර්මික අංශයට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11. ඩේවිඩ් කොපර්ෆීල්ඩ් නැමති ළමා නවකතාව රචිත ලේඛකයා වන්නේ
    (1) චාර්ස් ඩිකන්ස්ය. (2) ජේන් අයර්ය.
    (3) චාල්ස් බ්‍රොන්ටේය. (4) ලියෝ ටෝල්ස්ටෝයිය.

12. යහජීවනය සඳහා අවශ්‍ය ගුණාංගයක් වන්නේ
    (1) ලද දෙයින් සතුටුවීම
    (2) තමාට අවශ්‍ය දේ ලබා ගැනීමට ක්‍රියා කිරීම
    (3) තමාගේ පාඩුවේ සියලු වැඩ කටයුතු සිදුකර ගැනීම
    (4) අසමබර දිවිපෙවතක් ගත කිරීම.

13. ඔබට තනිව තීරණයක් ගත නොහැකි අවස්ථාවල ඔබ ක්‍රියා කළ යුත්තේ
    (1) මිතුරන් සමඟ ඒ පිළිබඳ සාකච්ඡා කිරීමයි. (2) මිතුරන් සමඟ එකතු වී තීරණයකට එළැඹීමයි.
    (3) වැඩිහිටියන්ගේ උපදෙස් පැතීමයි. (4) එම තීරණය නොගෙන සිටීමයි.

14. ස්වාභාවික විපතක් ලෙස සැලකෙන සුළි සුළං හමන අවස්ථාවකදී ඔබ ක්‍රියා කළ යුත්තේ

(1) වහාම නිවසින් එළියට පැන දිවීමයි (2) නිවස තුළම රැඳී සිටීමයි

(3) වාහනයක නැගී ප්‍රදේශයෙන් වහාම පිටවීමයි (4) නිවසේ වහලයට හෝ නැග ජීවිතය බේරා ගැනීමයි.

15. කිසියම් අයකු අනතුරට පත්වූ අවස්ථාවක ක්ෂණිකව ක්‍රියාත්මක වී අප ගතයුතු නිවැරදි ක්‍රියාමාර්ගය වන්නේ

(1) අනතුරට පත් පුද්ගලයා පසුකර යාම

(2) වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුකළයුතු නැද්ද යන්න පිළිබඳ සොයා බැලීම

(3) අනතුරට පත් පුද්ගලයා අසලට නොයෑම


(4) අනතුරට පත් පුද්ගලයාගේ වටිනා බඩුබාහිරාදිය පිළිබඳව සොයා බැලීම

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට A B පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**

A



B



16. A රූපයෙන් දක්වෙන්නේ ........................................................................................ පවුලකි.

17. පුද්ගලයකු සමාජයට හැඩ ගැස්වීමේ දී මූලික පුහුණුව ලැබන්නේ ........................................................................ තුළිනි.

18. එය තුළින් පුද්ගලයාට ............................................................... හොඳින් ලැබෙන්නේ නම් ඔහු තුළ ආත්ම විශ්වාසය හා සුරක්ෂිතතාව ඇතිවේ.

19. B රූපයෙන් දක්වෙන්නේ ............................................................. මහතාය.

20. ඔහු .................................................................. නිපදවා ලෝකයේ ගෞරවාදරයට පත් වූවෙකි.

(ල. 2 5 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) ස්වීරසාර ලෙස කටයුතු කිරීමට සිදුවන අවස්ථා 2ක් ලියන්න.

(ii) පොලීසියෙන් ඉටුවන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න.

(iii) මහගමසේකර නම් කලාකරුවා විසින් රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න.

(iv) මායා හා ඉන්කා ශිෂ්ටාචාරය ලොවට ඉදිරිපත් කළ දායාද දෙකක් ලියන්න.

(v) යහජීවන ගුණාංග අනුගමනය නොකිරීම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල 2ක් ලියන්න.


(vi) අප විසින් එදිනෙදා ගන්නා තීරණ වර්ග දෙක නම් කරන්න.

(vii) මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන අනතුරු දෙකක් ලියන්න.

(viii) සමුපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය ලියා දක්වන්න. (ල. 2 5 8 = 16)

02. (i) තාක්ෂණය අතින් ඉදිරියට පිය නගන විශ්ව ගම්මානයේ දනුම් දොරටු දෙකක් ලියන්න. (ල. 02)

(ii) පහත සඳහන්වන රූප තුන නම් කරන්න.

1 


2 

3 

(ල. 03)

(iii) ගෝලීයකරණය නිසා ලංකාවට සිදුවන වාසි තුනක් හා අවාසි තුනක් ලියන්න. (ල. 06)

03. (i) මෙම රූපයේ සිටින ආදර්ශවත් නායකයා කවුද? (ල. 01)



(ii) ඔහු තම වර්ගයාගෙන් ඉල්ලා සිටි ඉල්ලීම් දෙකක් ලියන්න. (ල. 02)

(iii) පහත රූපවල සිටින පුද්ගලයින් නම්කර ඔවුන් සතු ආදර්ශවත් චරිත ලක්ෂණ එක බැගින් ලියන්න.(ල. 08)

(1) 

(2) 


(3) 

(4) 

04. (i) ඖෂධ භාවිතා කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ල. 02)

(ii) පහත රූප දෙක නම්කර එවන් අවස්ථාවකදී ආරක්ෂාව සඳහා අනුගමනය කළයුතු කාර්යයන් දෙක බැගින් ලියන්න. (ල. 06)

1 

2 

(iii) අනතුරු හා ආපදා නිසි පරිදි කළමනාකරණය කරගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග 3ක් ලියන්න. (ල. 03)

05. (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් 2ක් නම් කරන්න. (ල. 02)

(ii) ග්‍රීක ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලනයට සහභාගී වීමට අවස්ථාව නොලැබුණු සමාජ කණ්ඩායම් 2ක් ලියන්න. (ල. 02)

(iii) (i) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටලු 3ක් ලියන්න. (ල. 03)

(ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටවල් 4ක් ලියන්න. (ල. 04)

06. (i) පහත නිල ලාංඡන දක්වෙන ආයතන වලින් ඉටුවන ප්‍රධාන කාර්යයන් 2 බැගින් ලියන්න. (ල. 04)







(ii) සමාජ සුරක්ෂිතතාව සඳහා පාසලෙන් ඉටුවන කාර්යයන් හතරක් ලියන්න. (ල. 04)

(iii) සමාජ සුරක්ෂිතතාවය බිඳවැටීමට බලපාන හේතු 3ක් ලියන්න. (ල. 03)

07. (i) වර්තමානය වනවිට දක්නට ඇති විවිධ සමුපකාර සමිති තුනක් නම් කරන්න. (ල. 03)

(ii) විවිධ සේවා සමුපකාර සමිතියක පවතින සංවිධාන ව්‍යුහය ඇසුරින් පහත රූප සටහනේ හිස්තැන්වලට අදාල පිළිතුර ලියන්න.




(ල. 05)

(iii) 1995 ජාත්‍යන්තර සමුපකාර සන්ධානය විසින් සමුපකාර ව්‍යාපාරය සඳහා හඳුන්වා දුන් ප්‍රතිපත්ති හතෙන් 3ක් නම් කරන්න. (ල. 03)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

### පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ඇල්බට් අයින්ස්ටයින් | 2. | මොළයට | 3. | අභියෝග | 4. | සිවිල් ආරක්ෂක බලකාය |
| 5. | පුවත්පත් | 6. | 3 | 7. | 5 | 8. | 5 |
| 9. | 4 | 10. | 4 | 11. | (1) | 12. | (1) |
| 13. | (3) | 14. | (2) | 15. | (2) | 16. | සුහදශීලී පවුලක් |
| 17. | පවුල | 18. | ආදරය, දයාව, කරුණාව | 19. | තෝමස් අල්වා එඩිසන් | 20. | විදුලි බල්බය |

(ල. 2 5 20 = 40)

### II කොටස

01. (i) යම් අසාධාරණයක් සිදු වූ විට, අසත්‍ය චෝදනා එල්ල වූ විට, තවත් කෙනෙකු විවේචනය කරන විට, කෝපයට පත් පුද්ගලයකු සමග කථා කරන විට
(ii) නීතිය හා සාමය සුරැකීම, මහජනතාව හා ඔවුන්ගේ දේපල සුරැකීම ...ආදී
(iii) සක්වා ලිහිණි, බෝඩිම, ප්‍රබුද්ධ ..... ආදී
(iv) නගර නිර්මාණය, චොකලට් පානය
(v) ගැළපෙන පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.
(vi) සුපුරුදු තීරණ, හැඟීම්බර තීරණ, කල්පනාකාරී තීරණ
(vii) රිය අනතුරු, ගොඩනැගිලි, කඩා වැටීම් .... ආදී
(viii) එකා සැමටත් සැම එකාටත් (ල. 2 5 8 = 16)


02. (i) පොත්පත්, පරිගණකය, අන්තර්ජාල ... ආදී (ල. 2)
(ii) 1. මඩු දේවස්ථානය 2. මුන්නේස්වරම් කෝවිල
3. මාතර ඉස්ලාම් මස්ජිදය (ල. 3)
(iii) වාසි :-සංචාරක කටයුතු දියුණුවීම, ශ්‍රම වෙළෙඳ පල පුළුල්වීම, ජාත්‍යන්තර වෙළඳාම පුළුල් වීම
අවාසි:- පාරිසරික ගැටලු වැඩිවීම, H.I.V වැනි රෝග පැතිරීම, ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය වැනි උවදුරු ව්‍යාප්ත වීම (ල. 6)

03. (i) තිසාහාමි (ල. 1)
(ii) කැලේ තියෙන ගස් කපන්න එපා.
කොඩිවැල් එල්ලා පරිසරය විනාශ කරන්න එපා.
(ල. 2)
(iii) 1. මර්සලින් ජයකොඩි පියතුමා
2. ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම්
3. රතු ඉන්දියානු නායක සියැටෙල්
4. ශ්‍රී ජවහර්ලාල් නේරු ලියා ඇති චරිත ලක්ෂණවලට ගැළපෙන පරිදි ලකුණු දෙන්න.
(ල. 8)

04. (i) ඖෂධවල නියමිත මාත්‍රාව ගැනීම (ල. 2)
කල් ඉකුත්වන දිනය පිළිබඳ සැලකිලිමත්වීම ... ආදී
(ii) 1. ගංවතුර 2. නායයෑම්
අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග වලට ගැළපෙන පරිදි ලකුණු දෙන්න. (ල. 6)
(iii) උපක්‍රමශීලී වීම
මනා සිහියෙන් යුතුව කටයුතු කිරීම
බුද්ධිමත්වීම (ල. 3)

05. (i) ඒබ්‍රහම් ලින්කන්, සීලර් (ල. 2)
(ii) ස්ත්‍රීන්, වහලුන්, විදේශ වෙළඳුන් (ල. 2)
(iii) 1. ජනගහන වර්ධනය, සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම, රාජ්‍යයන්ගේ භූමි ප්‍රමාණය විශාලවීම(ල. 3)
2. මහා බ්‍රිතාන්‍ය, ශ්‍රී ලංකාව, ප්‍රංශය, නවසීලන්තය, ඉන්දියාව, ජපානය, කැනඩාව (ල. 4)

06. (i) ගැළපෙන පරිදි ලකුණු ලබා දෙන්න.
(ii) විෂය දැනුම හා අවබෝධය ලබාදීම (ල. 4)
දක්ෂතා හඳුනාගෙන ඒවා වර්ධනය කිරීම
පෞරුෂ සංවර්ධන අවස්ථා ඇතිකිරීම
සාමූහිකත්වයෙන් ක්‍රියා කිරීමට හුරු කිරීම .. ආදී
(ල. 4)
(iii) නීති ගරුක නොවීම
පවුල් සංස්ථාව බිඳ වැටීම
දිළිඳුකම (ල. 3)
අන්මත නොඉවසීම
සමාජ සාරධර්ම පිරිහීම... ආදී

07. (i) විවිධ සේවා සමුපකාර සමිති
සකසුරුවම් හා ණය දෙන සමිති
පාසල් සමුපකාර සමිති ... ආදී (ල. 3)
(ii)


(ල. 5)
(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
ස්වෛරී භාවය හා නිදහස
අධ්‍යාපනය, පුහුණුව හා දැනුවත් බව ... ආදී (ල. 3)